සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

11 | S | I

## පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2020

## First Term Test - Grade 11 - 2020

**නම/විභාග අංකය :......................................  බුද්ධ ධර්මය - I**  **කාලය: පැය 01යි.**

වැදගත් :

- ✳ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40ක් හිමිවේ.
- ✳ අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ✳ ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැළපෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

(1) මම සසර දුකට මුලවන පඤ්චස්කන්ධය නැමැති ගෙය තනන වඩුවා සොයා සසර නොයෙක් ජාතිවල ඇවිද්දෙමි. මෙම අදහස් ඇතුළත් ගාථාව වන්නේ,

1. න තං කම්මං කතං සාධු යන ගාථාවෙනි.
2. අනේක ජාති සංසාරං යන ගාථාවෙනි.
3. තුම්හෙහි කිච්චං ආතප්පං යන ගාථාවෙනි.
4. අග්ගෝ හමස්මි ලෝකස්ස යන ගාථාවෙනි.

(2) බුදුරජාණන් වහන්සේට මුහුණ පෑමට සිදු වූ ප්‍රධානතම අභියෝගය වූයේ දුක් සහිත වූ පංචස්කන්ධය නැති කිරීමයි. එම පංචස්කන්ධ නම්,

1. රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ
2. චක්ඛු, සෝත,ඝාණ, ජිව්හා, කාය
3. ඇස. කණ නාසය, දිව ශරීරය
4. පඨවි, ආපෝ, තේජෝ, වායෝ, ආකාස

(3) බෝසත් උතුමෝ බුද්ධත්වය පතා පුරන ලබන උතුම් සමූහය වනුයේ,

1. දස රාජ ධර්ම නමිනි.
2. දස සක්විති වත් නමිනි
3. දස පාරමිතා නමිනි
4. දස පුණ්‍ය ක්‍රියා නිමිනි.

(4) බුදුරජාණන් වහන්සේට ද, ධර්මයට ද අගුණ කියමින් හා ගුණ කියමින් පැමිණි පරිබ්‍රාජකයා හා අන්තේවාසිකයා පිළිවෙලින් කවරහු ද?

1. බ්‍රහ්ම දත්ත හා සුප්‍රබුද්ධ
2. සුප්පියා හා ඉසිදත්ත
3. සුප්පියා හා සෝණදණ්ඩ
4. සුප්පියා හා බ්‍රහ්මදත්ත

(5) බුදුපියාණන් වහන්සේ දේශනා කර ඇති පරිදි සිත කිළිටි කරන කුසල් සිත්වලට බාධා පමුණුවන සිතිවිලි කුමන නමකින් හැඳින්වේ ද?

1. පඤ්චනීවරණ ධර්මය
2. පඤ්ච නියාම ධර්මය
3. අෂ්ට ලෝක ධර්මය
4. සේඛියා ධර්මය

(6) බුද්ධ කාරක ධර්මවලට අයත් නොවන්නේ,

1. සීල පාරමිතාවයි.
2. කරුණා පාරමිතාවයි.
3. දාන පාරමිතාවයි.
4. සත්‍ය පාරමිතාවයි.

(7) බුදුපියාණන් වහන්සේ ඇතුලු මහා සංඝ රත්නයට ඉතා රළු කටුක ආහාර වැළඳීමට සිදුවූයේ කුමන වස් කාලයේ ද?

1. පස්වන වස් කාලයේදී ය.
2. දසවන වස් කාලයේදී ය.
3. දොළොස්වන වස්කාලයේදී ය.
4. අටවන වස් කාලයේදී ය.

(8) බුදුරජාණන් වහන්සේට වේළුවනාරාමය හා ජේතවනාරාමය පූජා කළේ,

1. බිම්බිසාර රජු හා විශාඛා සිටුදේවිය විසිනි.
2. කොසොල් රජතුමා හා මල්ලිකා දේවිය විසිනි.
3. අනේපිඬු සිටුතුමා හා විශාඛා සිටුදේවිය විසිනි.
4. බිම්බිසාර රජතුමා හා අනේපිඬු සිටුතුමා විසිනි.

(9) බොදු බැතිමතුන්ගේ ගෞරවාදරයට පාත්‍ර වූ ධම්ම පදය අයත් නිකාය ග්‍රන්ථය,

1. ඛුද්දක නිකායට ය.
2. අංගුත්තර නිකායට ය.
3. සංයුක්ත නිකායට ය.
4. මජ්ඣිම නිකායට ය.

(10) පුද්ගල සිත සමාධිගත කර ගැනීමට ඉවහල්වන සමථ භාවනාව සඳහා යොදා ගත හැකි කර්මස්ථාන ගණන,

1. 20 කි.
2. 40 කි.
3. 35 කි.
4. 30 කි.

(11) සුදොවුන් රජතුමා ඍතු තුනට ගැලපෙන ලෙස මාළිගා තුනක් කර දුන්නේ ය. ඒ අනුව අනු පිළිවෙලින් ගිම්හාන හා වස්සාන ඍතු සඳහා ලබාදුන් මාලිගා ඇති වරණය කුමක් ද?

1. රම්‍ය, සුභ
2. රම්‍ය, සුරම්‍ය
3. සුභ, රම්‍ය
4. සුභ, සුරම්‍ය

(12) බුදුහිමි ලබා දුන් තනතුරු පිළිබඳව අතෘප්තිමත්ව සිටි භික්ෂුව වූයේ,

1. රාහුල තෙරුන් ය
2. ඡන්න තෙරුන් ය.
3. සැරියුත් තෙරුන් ය.
4. ආනන්ද තෙරුන් ය.

(13) සප්ත අපරිහාණීය ධර්ම තම රාජ්‍යපාලන ප්‍රතිපත්ති ලෙස සලකා රාජ්‍ය පාලනය ගෙන ගිය බුද්ධ කාලීන භාරතීය රාජ්‍ය වූයේ,

1. කෝසල රාජ්‍යයයි.
2. කාසි රාජ්‍යයයි.
3. වත්ස රාජ්‍යයයි
4. වජ්ජි රාජ්‍යයයි.

(14) තමා උපමා කොට වරදින් වැළකී සිටීම බුදු දහමේ හැඳින්වෙන්නේ,

1. අත්තාධිපතෙය්‍ය නමිනි.
2. ධම්මාධිපතෙය්‍ය නමිනි.
3. ලෝකාධිපතෙය්‍ය නමිනි.
4. අත්තූපනායික ධර්ම නිමිනි

(15) ''මෙසේ බුදුහු දෙව්රම් වෙහෙර දහම් අමා වහරේ වසමින් වැඩවසනුවෝ තුන් ලෙව්හි සැරි සැරූ උපාලි ගෘහපතීහු ඈ ................'' යනාදී ප්‍රකාශය තුළින් පුරිස දම්ම සාරථී ගුණය විස්තර කෙරේ. මෙම කොටස උපුටා ගත් කෘතිය වනුයේ,

1. බුත්සරණ යි.
2. සද්ධර්මරත්නාවලිය
3. අමාවතුර ය.
4. කව්සිළුමිණ යි

(16) බුදු දහමේ දැක්වෙන පරිදි බෞද්ධ අපගේ පරම අපේක්ෂාව වන්නේ,

1. සිල් රැකීම ය.
2. නිර්වාණාවබෝධයයි.
3. දානමානාදී පිංකම් කිරීමයි.
4. භාවනා කිරීමයි.

(17) පුද්ගලයා නිර්මාණය වී ඇති පංචස්කන්ධය දෙස ගැඹුරින් බැලීමට දහමේ උගන්වන භාවනාව වන්නේ,

1. විදර්ශනා භාවනාවයි
2. ආනාපානසති භාවනාවයි.
3. සමථ භාවනාවයි
4. බුද්ධානුස්සති භාවනාවයි

(18) අනගාරික ධර්මපාල තුමා 1931 දී ගිහියෙකු වශයෙන් පනස් හත්වන වියේ දී අවසන් දේශනය කළේ,

1. විද්‍යාලංකාර පිරිවෙන් භූමියේ දී ය.
2. විද්‍යෝදය පිරිවෙන් භූමියේදී ය.
3. බලගල්ල සරස්වතී පිරිවෙන භූමියේ දී ය.
4. නියම කන්ද පිරිවෙන් භූමියේ දී ය.

(19) ''දුර ගමන් යන තනිව හැසිරෙන ශරීරයක් නැති ගුහාවක වෙසෙන සිත දමනය කර ගන්නා තැනැත්තා මාරයාගෙන් මිදේ'' යන අදහස පැහැදිලි වන ''ධම්ම පද'' ගාථාවේ මුල් පදය වූයේ.

1. අචරිත්වා බ්‍රහ්මචරියං
2. තංච කම්මං කතං සාධු
3. දූරංගමං ඒකචරං
4. උට්ඨානවතෝ සතිමතෝ

(20) ණය ගැතියකු, ණය හිමිට යම් බැඳීමක් ඇති විට වහලකු මෙන් යටත් වන බව පැහැදිලි කළ සූත්‍රය වන්නේ,

1. පරාභව සූත්‍රයයි
2. අග්ගඤ්ඤ සූත්‍රයයි
3. වසල සූත්‍රයයි.
4. සාමඤ්ඤඵල සූත්‍රයයි

(21) තර්කානුකූලව විමසුම් සිතින් කටයුතු කරන චරිතය වන්නේ මින් කුමක් ද?

1. විතර්ක චරිතයයි
2. බුද්ධි චරිතයයි
3. රාග චරිතයයි
4. සද්ධා චරිතයයි

(22) රේරුකානේ චන්දවිමල මාහිමියන් විසින් රචිත ග්‍රන්ථයක් නොවන්නේ,

1. බෞද්ධයාගේ අත්පොතයි
2. බුදුගුණ අලංකාරයයි.
3. ධර්ම විනිශ්චයයි
4. පාරමිතා ප්‍රකරණයයි

(23) සිතින් සිදුවන අකුසල කර්මය වන්නේ මින් කවරක් ද?

1. පිසුනාවාචා යි
2. මුසාවාද යි
3. ව්‍යාපාදය යි
4. අදත්තාදානය යි

(24) ''ආරංචි මාත්‍රයෙන්, පරම්පරාවෙන් පැවත එන, කටකතා මගින් යමක් නොපිළිගත යුතුයැයි බුදුහිමි දේශනා කළේ,

1. ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේදී ය.
2. මංගල සූත්‍රයේදී ය
3. සච්ච විභංග සූත්‍රයේදී ය.
4. කාලාම සූත්‍රයේදී ය.

(25) කුසලා කුසල කර්ම රැස් කිරීම හේතු කොටගෙන ප්‍රතිසන්ධි සිත පහළ වේ. යන සිංහල අදහසට උචිත පාලි පාඨය වන්නේ,

1. අවිජ්ජා පච්චයා සංඛාරා ය.
2. විඤ්ඤාණ පච්චයා නාම රූපං ය.
3. සංඛාර පච්චයා විඤ්ඤාණං ය.
4. නාම රූප පච්චයා සළායතනං ය.

(26) ''කාලා රසමුසු භෝජන කර පෙම්'' යන කවිය ඇතුළත් වන්නේ,

1. බුදුගුණ අලංකාරයට ය.
2. සිරිත් මල්දමට ය.
3. ලෝවැඩ සඟරාවට ය.
4. කාව්‍යශේඛරයට ය.

(27) ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ මෙලොව දියුණුවට දේශිත කරුණු සතර වන්නේ,

1. පඨවි, අපෝ, තේජෝ වායෝ යනුවෙනි.
2. උට්ඨාන සම්පදා, ආරක්ඛ සම්පදා, කල්‍යාණ මිත්තතා සමජීවිකතා යනුවෙනි.
3. සද්ධා, සීල, සමාධි, ප්‍රඥා යනුවෙනි
4. වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ යනුවෙනි.

(28) ත්‍රිවිධ රත්නය පිළිබඳ කරුණු දැන ඇති කර ගන්නා පැහැදීම,

1. අවෙච්චප්පසාදය නම් වේ.
2. අමූලික ශ්‍රද්ධාව නම් වේ.
3. භක්තිය නම් වේ.
4. තුන්තරා බෝධිය නම් වේ.

(29) පුද්ගල දියුණුවට හේතු වන කරුණු මහා මංගල සූත්‍රයේ දේශනා කර ඇත. එහි ඇතුළත් කරුණු ප්‍රමාණය,

1. 38 කි.
2. 32 කි.
3. 35 කි.
4. 28 කි.

(30) ''කාලේන ධම්ම සාකච්ඡා'' යන දහම් පදයෙන් ප්‍රකාශ වන්නේ,

1. උත්තමයන්ගේ අවවා ද පිළිගැනීම යන්නයි.
2. සුදුසු කල්හි ධර්ම සාකච්ඡා පැවැත්වීම යන්නයි.
3. නිවැරදි ජීවන වෘත්තීන්හි යෙදීම යන්නයි.
4. සුදුසු කාලයෙහි ධර්ම ශ්‍රවණය කිරීම යන්නයි.

(31) ''ඉක්ම ගිය යොවුන් බව ඇති මිනිසෙකු ලාබාල තරුණියකු සරණ පාවාගෙන ඇය කෙරෙහි ඊර්ෂ්‍යාවෙන් නොනිදා වෙහෙසීම'' දෙලොව දිවිය පිරිහීමට හේතුවන බව දේශනා කළේ,

1. මංගල සූත්‍රය තුළිනි
2. වසල සූත්‍රය තුළිනි
3. පරාභව සූත්‍රය තුලිනි.
4. පත්තකම්ම සූත්‍රය තුලිනි

(32) ''සම්බුදු සසුන බේරා ගැනීමට තවත් විසිපස් වතාවක් මේ දඹදිව ඉපදේවායි'' යන පැතුම ඇතිව අවසන් සුසුම් හෙලුවේ මින් කවරෙක් ද?

1. පූජ්‍ය වල්පොල රාහුල හිමි.
2. පූජ්‍ය අරලිය තැන්නේ හිමි
3. පූජ්‍ය රේරුකානේ චන්දවිමල හිමි
4. පූජ්‍ය සිරි දේවමිත්ත හිමි

(33) ගර්භයේ හැඩය අනුව ප්‍රධාන වශයෙන් ස්තූප සයාකාර වේ. ''දිය බුබුලක හැඩය'' ගනිමින් නිර්මාණය කළ ස්තූප වර්ගය හඳුන්වන්නේ,

1. බුබ්බුලාකාර ලෙස ය.
2. ඝටාකාර ලෙස ය.
3. පද්මාකාර ලෙස ය.
4. ආමලකාර ලෙස ය.

(34) නිවන් මගට පිවිසෙන පුද්ගලයෙකු විසින් අනුගමනය කළ යුතු නිවැරදි අනුපිළිවෙළ සහිත වරණය තෝරන්න.

1. ප්‍රඥා, සීල, සමාධි, සද්ධා
2. සද්ධා, සීල, සමාධි, ප්‍රඥා
3. සීල,සමාධි, සද්ධා, ප්‍රඥා
4. සමාධි, සද්ධා, සීල, ප්‍රඥා

(35) බුදුදහම ව්‍යාප්ත නොවූ බටහිර රටවලට පසු කාලයේ දී දැනුම ලබාදීම පිණිස එංගලන්තයේ පාලි පොත් සමාගම නිර්මාණය වූයේ කිනම් ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙසද?

1. ප්‍රථම ධර්ම සංගායනාවෙනි.
2. තෙවන ධර්ම සංගායනාවෙනි
3. හතරවන මහායාන ධර්ම සංගායනාවෙනි
4. දෙවන ධර්ම සංගායනාවෙනි

(36) සිංහල සාහිත්‍යයට නව අරහාදී බුදුගුණවල '''අරහං ගුණය'' තේමා කරගෙන පූජාවලිය නම් ග්‍රන්ථය රචනා කළේ,

1. ගුරුළුගෝමී පඬිතුමා ය.
2. විද්‍යා චක්‍රවර්තී පඬිතුමා ය
3. ධර්මසේන හිමියන් ය.
4. මයුරපාද පිරිවෙන්හි බුද්ධ පුත්‍ර හිමියන් ය.

(37) සප්ත අපරිහාණීය ධර්මවලට ඇතුළත් නොවන කරුණ මින් කුමක් ද?

1. නිතර නිතර රැස්වීම
2. සමගිව රැස් ව සමගිව විසිරයාම
3. කාන්තාවන්ට ආරක්ෂාව සැළසීම
4. පෙර නොපැනවූ නීති පැනවීම හා පනවන ලද නීති කඩ නොකොට ආරක්ෂා කිරීම

(38) ගසක මල් හටගෙන ක්‍රමයෙන් පිපී කලක් පැවත පරවී යයි. මෙම ස්වභාවය පෙන්නුම් කරන බෞද්ධ ඉගැන්වීම,

1. දුක්ඛ ධර්මතාවයයි.
2. අනාත්ම ධර්මතාවයයි.
3. අනිත්‍ය ධර්මතාවයයි
4. හිරි ඔත්තප්ප ධර්මතාවයයි

(39) බුදු දහමේ ඉගැන්වෙන පරිදි ධාර්මික පාලකයෙකු අනුගමනය නොකළ යුතු කරුණක් වන්නේ,

1. දසරාජ ධර්මයයි
2. සතර අගතියයි
3. සතර සංග්‍රහ වස්තුවයි
4. සප්ත අපරිහානි ධර්මයයි

(40) මිරිස් මාලුවක් භික්ෂූන් වහන්සේලාට නොදී අනුභව කළ පවින් වැළකීමට මිරිසවැටිය නම් ස්තූපය ඉදි කළ රජු වූයේ,

1. දේවානම්පියතිස්ස රජු ය
2. වළගම්බා රජු ය
3. දුටුගැමුණු රජු ය.
4. මහසෙන් රජු ය.

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

11 S II

## පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2020
## First Term Test - Grade 11 - 2020

නම/විභාග අංකය :....................................... බුද්ධ ධර්මය - II කාලය: පැය 02යි.

වැදගත් :

✳ පළමු ප්‍රශ්නය ඇතුලුව තවත් ප්‍රශ්න හතරක් සහිතව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

✳ පළමු ප්‍රශ්නයට ලකුණු 20 යි. අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් හිමිවේ.

(1) (i) සිදුහත් බෝසතාණන් වහන්සේ සත්‍ය ගවේෂීව වැඩසිටි සමයේ හමු වූ ගුරුවරුන් දෙදෙනකු නම් කරන්න.

(ii) තණ්හාවේ ප්‍රභේද තුන ලියන්න.

(iii) ''සිංහලයනි නැගිටිව් බුද්ධගයාව බේරාගනිව්'' යනුවෙන් ප්‍රකාශ කළ අය කවුරුන් ද?

(iv) බුදුදහමේ උගන්වන කුසල මූල තුන නම් කරන්න.

(v) සතර පෙර නිමිති ලියන්න.

(vi) ''යෝ ගිලානං උපට්ඨෙය්‍ය සෝ මං උපට්ඨෙය්‍ය'' යන්නෙහි අර්ථය ලියන්න.

(vii) බුදු සසුනේ ප්‍රථම ශ්‍රාවකයා සහ ප්‍රථම ශ්‍රාවිකාව නම් කරන්න.

(viii) පොළොන්නරු යුගයේදී ලියවුන ''සසදාවත'' කෘතියට පාදක වූ ජාතක කථාව කුමක්ද?

(ix) අනුරාධපුරයේ ඇති අභයගිරි දාගැබ සහ ලෝවා මහා ප්‍රාසාදය නිර්මාණය කළ රජවරුන් දෙදෙනා නම් කරන්න.

(x) ''අසේවනා ච බාලානං පණ්ඩිතානං ච සේවනා'' මෙහි සඳහන් මංගල කරුණු මොනවා ද?

(2) (i) සිඟාලෝවාද සූත්‍රයේදී නැගෙනහිර දිසාවෙන් හා දකුණු දිසාවෙන් පෙන්වා දෙන සමාජ කණ්ඩායම් නම් කරන්න.

(ii) ඉහත (i) හි සඳහන් නැගෙනහිර දිසාවෙ සමාජ කණ්ඩායමට ඔබ විසින් ඉටුකළ යුතු යුතුකම් තුනක් ලියන්න.

(iii) යුතුකම් ඉටුකරන යහපත් සමාජ සම්බන්ධතාවයක් ගොඩනගා ගැනීමට සදිසා සංග්‍රහය බෙහෙවින් ඉවහල් වෙයි. විමසන්න.

(3) (i) ''තරුණ වයසේ දී පිළිවෙත් වල නොහැසිර කොස්වාලිහිණියකු මෙන් තැවෙති'' යන අර්ථය දෙන ධම්මපද ගාථාව ලියන්න.

(ii) එහි අර්ථය ලියන්න.

(iii) යහපත් පුද්ගල ජීවිතයක් ගත කිරීමට ධම්මපදයෙන් ලැබෙන උපදෙස් අගයන්න.

(4) (i) පඤ්ච නීවරණ ධර්ම අතරින් දෙකක් ලියන්න.

(ii) බෞද්ධ භාවනාවේ ප්‍රධාන ප්‍රභේද දෙක ලියා කෙටියෙන් හඳුන්වන්න.

(iii) ''බෞද්ධ භාවනාව තුළින් ලෞකික මෙන් ම ලෝකෝත්තර වශයෙන් ද ප්‍රතිඵල ලබාගත හැකිය'' අප ජීවිතයට භාවනාව හුරු කිරීමෙන් ලැබෙන ප්‍රතිඵල අගයන්න.

(5) (i) දස පාරමිතා වලින් දෙකක් ලියන්න.

(ii) ඉහත (i) හි නම් කළ එක් පාරමිතාවක් පැහැදිලි කරන්න.

(iii) පරිත්‍යාගශීලීව ජීවත්වීමටත්, සිල්වත්වීම තුළින් අර්ථවත් ශිෂ්‍ය ජීවිත ගත කිරීමට පාරමිතා උපයෝගී කර ගත හැක. අදාළ පාරමිතා ඇසුරු කරගෙන විස්තර කරන්න.

(6) (i) ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ සඳහන් මෙලොව ජීවිතයට හිතසුව පවත්නා කරුණු අතරින් දෙකක් ලියන්න.

(ii) ඉහත (i) හි සඳහන් කළ එකක් කෙටියෙන් පහදන්න.

(iii) සූත්‍ර දේශනා පුද්ගලයාගේ මෙලොව දියුණුවට මෙන් ම පරලොව දියුණුවට ද බෙහෙවින් උපකාරී වේ. විමසන්න.

(7) පහත සඳහන් මාතෘකා අතරින් **<u>දෙකක්</u>** තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

(i) පූජ්‍ය රේරුකානේ චන්දවිමල නාහිමි

(ii) පුරිස දම්ම සාරථී ගුණය

(iii) ස්තූපය

(iv) සද්ධර්මරත්නාවලිය

**Answer**

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

11 | S | I II

## පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2020
## First Term Test - Grade 11 - 2020

## බුද්ධ ධර්මය - පිළිතුරු පත්‍රය

### I පත්‍රය

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 11 | 1 | 21 | 1 | 31 | 3 |
| 2 | 1 | 12 | 2 | 22 | 2 | 32 | 4 |
| 3 | 3 | 13 | 4 | 23 | 3 | 33 | 1 |
| 4 | 4 | 14 | 4 | 24 | 4 | 34 | 2 |
| 5 | 1 | 15 | 3 | 25 | 3 | 35 | 3 |
| 6 | 2 | 16 | 2 | 26 | 3 | 36 | 4 |
| 7 | 3 | 17 | 1 | 27 | 2 | 37 | 4 |
| 8 | 4 | 18 | 2 | 28 | 1 | 38 | 3 |
| 9 | 1 | 19 | 3 | 29 | 1 | 39 | 2 |
| 10 | 2 | 20 | 4 | 30 | 2 | 40 | 3 |

### II පත්‍රය

(1) (i) ආලාර කාලාම, උද්දකරාම පුත්ත, භග්ගව (10 - 24 පිටු)
(ii) කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා (10 - 85 පිටු)
(iii) ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා (11 - 47 පිටු)
(iv) අලෝභ, අදෝස, අමෝහ (10 - 24 පිටුව 11 - 70 - 71 පිටුව)
(v) මහල්ලෙක්, ලෙඩෙක්, මළකඳක්, පැවිදි රුවක, (10 පිටුව 3)
(vi) ගිලනුන්ට උපස්ථාන කරන්නා මට උපස්ථාන කරන්නේ ය. (11 - 8 පිටු)
(vii) කොණ්ඩඤ්ඤ බමුණා මහා ප්‍රජාපතී ගෝතමිය
(viii) සස ජාතකය (10 - 120 පිටුව)
(ix) වට්ට ගාමිණී (වලගම්බා රජු) දුටුගැමුණු රජතුමා (10 - 38 පිටුව 10 - 103 පිටුව)
(x) අනුවණයන් ඇසුරු නොකිරීම නුවණැතියන් ඇසුරු කිරීම (11 - 65 පිටුව)

(2) (i) නැගෙනහිර - මව්පියන්
දකුණ - ගුරුවරුන් (10 - 50 පිටුව)

(ii) මව්පියන් පෝෂණය
දෙමාපිය කටයුතු සොයාබලා ඉටුකරදීම
කුල පරපුර හා සිරිත් විරිත් ආරක්ෂා කිරීම
දෙමාපියන්ගෙන් හිමි වූ දේ රැකගැනීම
මියගිය පසුව පින් අනුමෝදන් කිරීම (10 - 51 පිටුව)

(iii) සදිසාවලින් දැක්වෙන සමාජ කණ්ඩායම් එකිනෙකාට යුතුකම් හා වගකීම් ඉටුකළ යුතුය. එවිට ධාර්මික නොබිඳුන සම්බන්ධතා ගොඩනැගේ. යුතුකම් ඉටුකිරීම වන්නේ එකිනෙකාට සංග්‍රහ කිරීමය. එම ආචාර ධර්මය නිසා සමාජ කොටස් අතර විශ්වාසය වැඩි වී ඔවුන්ගේ අභිවෘද්ධිය ඇතිවේ.

දෙමාපියන් හා දරුවන් අතර ඇතිවන නොමනාපකම් නිසා දුකට පත්න පිරිස් බොහෝය. තම යුතුකම් නිසි පරිදි ඉටුකිරීමෙන් සාමයෙන් සමගියෙන් පවත්වන මව්පියන් හා දූදරුවෝ සැනසිලිදායක ජීවිත ගත කරති. නිසි කලට නිසි ලෙස යුතුකම් ඉටුකිරීම දෙපිරිසේම යහපත සඳහා ඉවහල් වේ.

ගුරු ශිෂ්‍ය යුතුකම් මනාලෙස ඉටුවීමෙන් පරමාදර්ශී සමාජයකට මග පෑදේ. ගුරුවරයාට විශ්වාසයෙන් ඇල්මෙන් ක්‍රියාකර උපදෙස් පිළිගෙන ශිෂ්‍යයා තම ජීවිත සාර්ථක කරගත යුතු ය. එවිට ගුරුවරයා ද දයාවෙන් කරුණාවෙන් තම යුතුකම් මැනවින් ඉටුකරයි.

පවුල් සංස්ථාවේ දියුණුව පවතින්නේ අනොන්‍ය විශ්වාසය මත ය. දරුවන් ඇතුලු පවුලේ දියුණුවට සතුටට සාරධර්ම මත පිහිටා ක්‍රියා කළ යුතුය. එය පවුලේ දියුණුවට මනා පිටුවහලකි.

කල්‍යාණ මිත්‍රයන් හා ව්‍යාජ මිත්‍රයන් දෙපිරිස වෙන්කර හඳුනාගෙන කල්‍යාණ මිත්‍ර ඇසුර මෙන්ම මිත්‍ර ප්‍රතිරූපකයන් ගෙන් දුරස්වීම මෙලොව - පරලෙව දියුණුවට මෙන්ම අධ්‍යාත්මික බාහිර දියුණුවට හේතුවේ. ඇසුරු කිරීමට මිතුරන් නැති විට තනිව ජීවත්වීම සුදුසු ලෙස බුදුදහමේ දක්වූයේ එහෙයිනි.

සේව්‍ය සේවක දෙපිරිසේ විශ්වාසය, කැපවීම උපකාරීත්වය ආයතනයක දියුණුවට බලපායි. යුතුකම් හා වගකීම් නිසි පරිදි ඉටු වීමෙන් ආයතනවල ගැටුම් නිරාකරණය වේ. වංචනික දූෂණ ක්‍රියා අඩුවී ආයතනයේ දියුණුව ඇති වේ.

ගිහි පැවිදි සබඳතා නිසි පරිදි සිදුවීමෙන් ගිහියාගේ පිරිහීම වළකාලීමට ඉවහල් වේ.පැවිදි උතුමන් රක්ෂණය පෝෂණය කිරීමෙන් ගිහියා මෙලොව පරලොව සුගතියට මග හෙළි කර ගනී.සමාජ කොට්ඨාශ අතර යුතුකම් නිසි ලෙස ඉටු වීමෙන් සමාජ කණ්ඩායම් අතර අනෝන්‍ය විශ්වාසය බැඳීම ඇති වේ. හුදෙකලා බව දුරු වේ. මිත්‍රත්වය ගොඩනැගේ. දුක සැප බෙදා ගෙන ජීවත් වේ. අනෝන්‍ය විරසක වීම් ගැටුම් සමාජයෙන් තුරන් ව සමඟිය ඇති වේ.

(3) (i) අචරිත්වා බ්‍රහ්මචරියං
අලද්ධා යොබ්බනේ ධනං
ජින්න කොඤ්චාව ඣායන්ති
ඛීන මච්චේව පල්ලලේ (11 - 15 පිටුව)

(ii) තරුණ වයසේ දී උසස් පිළිවෙත්වල ද, නොහැසිර ලබාගත නොහැකි ධනය ද, නො ලැබ පසු මසුන් නැති දියසිඳුනු විලක් දෙස බලා දුක්වන කොස්වාලිහිණියතු මෙන් තැවෙති.

(iii) ධම්මපදය ත්‍රිපිටකයේ ධර්ම කරුණුවල සාරාංශයකි. බෞද්ධයාගේ අත්පොත ලෙස සැලකෙන එහි අඩංගු දහම් කරුණු කාල, දේශ, ජාති, ආගම් භේදයෙන් තොරව සියල්ලන්ටම පරිහරණය කළ හැක. ධම්මපදය පුරාම යහපත් පුද්ගල ජීවිතගත කිරීමට උපදෙස් ලබාදී ''අක්කෝච්ඡිමං අවධි මං'' ගාථා ධර්මයෙන් වෛරය නැවත මෙනෙහි නොකිරීමෙන් සංසිඳෙන අයුරු ද ''නතං කම්මං කතං සාධු''...... සිහිකල විට පසුතැවීමට හේතුවන ක්‍රියා නොකල යුතු බවද ''අත්තනාව කතං පාපං''පරිසිදු අපිරිසිදුකම පවතින්නේ තමා තුලම බවද යහපත් ක්‍රියා කිරීම දුෂ්කර බවද ''අචරිත්වා බ්‍රහ්ම චරියං'' ඉහත දක්වූ ගාථාවෙන් සුදුසු විට නිවැරදිව අප්‍රමාදව කටයුතු නොකිරීමෙන් පසුකාලයේ පසුතැවීමට හේතුවන බවද ''උට්ඨානවතෝ සතිමතෝ'' උත්සාහය නිවැරදි සිහිය වමසා බලා තැන්පත් බව, දැහැමි බව, අප්‍රමාදී බව, පුද්ගල දියුණුවට හේතුවන බව කියැවේ. ඉහත දක්වූ අයුරින් ගාථා ධර්මයන් 3 ක් වත් අවම ලෙස උදාහරණ කොට දක්වා ඇතිනම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.
(11 - 54 පිටු)

(4) (i) කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීනමිද්ධ, උද්ධච්ච, කුක්කුච්ච, විචිකිච්ඡා (11 - 34, 35 පිටු, 10 - 22-32 පිටු)

(ii) සමථ හා විදර්ශනා

***<u>සමථ භාවනාව</u>***

''චිත්තං සමේතීති සමථෝ'' සිත සංසුන් කරන්නේ සමථයයි. සිත දියුණු කරන නිසාම චිත්ත භාවනාව ලෙසද සිත සමාධි ගත කරන නිසා සමාධි භාවනාව ලෙසද හැඳින්වේ. සමථය නම් සංසිඳුවීම ය. සංවර කිරීමය. සිත් දූෂණය වූ අකුසල් දුරලා කුසල සී දියුණු කිරීමට සමථ භාවනාවෙන් සිදුවේ. පංචනිවරණ නම් වූ නිවන් මග අහුරණ ධර්ම සිතේ සමාධියට බාධා කරන නිසා ඒවා යටපත් කිරීම සිදුවේ.

විදර්ශනා

''විසේසේන පස්සතීති විපස්සනා'' යථාර්ථය නුවණින් අවබෝධ කර විශේෂයෙන් දැකීම විපස්සනාවයි. පංචස්කන්ධය ත්‍රිලක්ෂණයෙන් දැකීම සිදුවන නිසා ත්‍රි ලක්ෂණ භාවනාව ලෙස ද සසර දුකින් මුදවාලීමට උපකාරවන බැවින් ප්‍රඥා භාවනාව ලෙස ද හැඳින්වේ. ලෞකික ජීවිතයේ යථාර්ථය අවබෝධ කරගැනීමට මෙන්ම ලෝකෝත්තර නිවන් සැප ලැබීමට ඉවහල් වන්නේ ද විදර්ශනාවය.

(iii) බෞද්ධ භාවනා වූ සමථ - විදර්ශනා තුලින් මෙලොව පරලොව ජීවිත සාර්ථක කරගැනීමට ඉවහල් වේ. සමථ භාවනාව තුළින් කෙලෙස් සිතුවිලි පාලනය වේ. ධාරණ ශක්තිය වැඩි දියුණු වේ. සිහිය මනාකොට එක අරමුණකට ගත හැකිය. ගැටළු විසඳීමට ඉවහල් වේ. ඉවසීම ඇති වේ. පිළිවෙලකට යමක් කළ හැක. නිරෝගීවීමටත් අසහනය දුරලීමටත් සමථ- භාවනාව මෙලොව වශයෙන් ඉවහල් වේ. පංච අභිඥා අෂ්ට සමාපත්ති ලබාගැනීමට ද මෙමගින් හැකිවේ. විදර්ශනා භාවනාව තුලින් සැබෑ තත්වය නුවණින් මෙනෙහි කිරීමෙන් ජීවිතයේ නිසරු බව අස්ථිර බව, දුක් සහිත බව පිළිකුල් බව සියල්ල අනිත්‍ය බව වටහා ගැනීමට උපකාරී වේ. අසාර ජීවිත ගෙවමින් ඊර්ෂ්‍යා කිරීමෙන් වෛර කිරීමෙන් ඉවත් වේ. අසහනය දුරලා සිත ප්‍රබෝධමත් වේ. මෙලොව වශයෙන් තවදුරටත් අටලෝ දහමට මුහුණදීමට හැකිවේ. කම්පා නොවේ. එසේම විදර්ශනා භාවනාව තුලින් නිවන් අවබෝධයට මග පාදයි. මේ අනුව බෞද්ධ භාවනා තුලින් මෙලොව පරලොව ජයගත හැකි බව ඉතා පැහැදිලි ය.

(5) (i) 1 . දාන 2. සීල 3. නෙක්ඛම්ම 4. පඤ්ඤා 5. වීර්ය 6. ඛන්ති 7. සච්ච 8. අධිට්ඨාන 9. මෙත්තා 10. උපේක්ඛා

(ii) <u>දාන පාරමිතාව -</u> තණ්හා - මාන මිත්‍යා දෘෂ්ටියෙන් තොරව කරුණාවෙන් ප්‍රඥාවෙන්, පරිත්‍යාගශීලීව දිමනාව උදා:- වෙස්සන්තර ජාතකය

<u>සීල පාරමිතාව</u>- කය, වචනය දෙකේ සංවරය සීල යයි උදා:- සීල විමංස ජාතකය

<u>නෙක්ඛම්ම පාරමිතාව</u> - පංච ඉන්ද්‍රියන් පිනවීමෙන් වෙන්වීමය. උදා:- මඛාදේව ජාතකය

<u>ප්‍රඥා පාරමිතාව -</u> ජීවිතය හා ලෝකය ඇති තතු දැන නිවන් සොයා යාම. උදා:- උම්මග්ග ජාතකය

<u>වීර්යය පාරමිතාව</u> - බලාපොරොත්තු ඉටුවන තුරු නොබසුබට වීමේ පාරමිතාව උදා: වණ්ණුපථ ජාතකය

<u>ක්‍ෂාන්ති පාරමිතාව</u> - ඉවසීමේ පාරමිතිව උදා :- ක්‍ෂාන්තිවාදී ජාතකය

<u>සත්‍ය පාරමිතාව</u> - කිසිවෙකු නොරවටා මූලා නොකර සත්‍ය පිහිටා ක්‍රියා කිරීම උදා :- වට්ටක ජාතකය

<u>අධිෂ්ඨාන පාරමිතාව</u> - සිත වෙනස් නොවී ඒ අයුරින්ම පවත්වා ගැනීම උදා:- තේමිය ජාතකය

<u>මෛත්‍රී පාරමිතාව</u> - සියලු සත්තවයෝ සුවපත් වෙත්වා සිත පුරුදු පුහුණු කිරීම උදා:- මඝමානවක ජාතකය

<u>උපේක්‍ෂා පාරමිතාව</u> - සිතේ මැදිහත් බව උදා:- ලෝම හංස

(iii) <u>දාන</u> තමන්ට අයිති යමක් පූජාවක් වශයෙන් හෝ අනුග්‍රහයක් ලෙස ආශාව අත්හැර අපේක්‍ෂාවෙන් තොරව දීම දානයයි. තමන්ට වඩා උසස් සීලාදී ගුණධර්මයෙන් යුතු පූජ්‍ය පක්ෂයට දීම පූජා බුද්ධියෙන් දෙන දානයයි. යමෙකුගේ අසරණකම සලකා උපකාරයක් ලෙස කරුණාවෙන් අනුකම්පාවෙන් යමක් ලබාදීම අනුග්‍රහ බුද්ධියෙන් දෙන දානයයි පරිත්‍යාගශීලීවීම ශිෂ්‍යය ජීවිතය අර්ථවත් වීමට අවශ්‍යම වේ. දන්දීමෙන් ලෝභය, ද්වේශය දුරුවේ. මෛත්‍රී සහගත සිතිවිලි වර්ධනය වේ. ශිෂ්‍යයන් ලෙස තමා දන්නා විෂය කරුණු කියාදීමෙන් අවශ්‍ය පොත පත ලබාදීමෙන් කරුණා මෛත්‍රී සිතිවිලි වර්ධණය වේ. එසේම සමගිව කෑම බීම ආදිය බෙදා හදා ගැනීමෙන් සාමය, සමගිය සහජීවනයට හුරු වේ. අමතර ඇඳුම් පැළඳුම් නැති බැරි අයට ලබාවීමෙන් කරදර විපත් ඇති වූ අවස්ථාවලදී එසේ ලබාදීමට ඉදිරිපත් වීමෙන් දාන ප්‍රතිපදාව අර්ථවත් කල හැකිය.

සීල පාරමිතාව - කය වචන දෙකේ සංවරය සීලයයි ප්‍රාණඝාතය, අදත්තාදානය, කාමමිථ්‍යාාරයෙන් වැළකීම කායික සංවර සීලයයි. බොරුකීම, කේලාම් කීම, පරුෂ වචන කීම, හිස්වචන කීමෙන් වෙන්වීම, වාචසික සීලයයි. ශිෂ්‍යයෙකු ලෙස සීලය ජීවිතය අර්ථවත් කිරීමට ඉවහල් වේ. ශිෂ්‍යා යනු ශික්ෂණයක්, විනයක් පුහුණු වන්නාය. සසිල්වත් ීමෙන් පවින් වැළකී අන්‍ය ජීවිත රකී. දේපල ධනය ආරක්ෂා කරයි. වැරදි කාම සේවනයෙන් බැහැර වේ. අනුන් නොරවටයි. කේලාම්, හිස්වචන පරුෂ වචනයෙන් වෙන්වේ. මධ්‍යසාර භාවිතයෙන් වෙන්වේ. එසේ සිල්වත්වීමෙන් අන්‍යයන් අතර ගෞරවයට හේතුවේ. ප්‍රියවාදී වේ. සිල්වත් වූ මෙබඳු අය අන්‍යයන්ට හානි නොකරයි. යහපතක්ම සිදුකරන නිසා බියෙන් සැකයෙන් තොරව කල්‍යාණ මිත්‍ර ඇසර මැනවින් හඳුනාගනිමින් ජීවත්වේ. එබඳු ශිෂ්‍ය ජීවිත ගත කිරීමට වර්තමාන සමාජයට අවශ්‍යම වේ.

(11 - 18 සිට 30 දක්වා පිටු)

(6) (i) 1. උට්ඨාන සම්පදා 2. ආරක්ඛ සම්පදා 3. කල්‍යාණ මිත්තා 4. සමජීවකතා (11 - 62 පිටුව)

(ii) <u>උට්ඨාන සම්පදා</u> - තමන් කරන කිනම් වෘත්තියක් වුවද උත්සාහයෙන් දැතේ මහන්සියෙන් දහදිය හෙලමින් ධාර්මිකව කිරීම, එබඳු රැකියා කෘෂිකර්මාන්තය වෙළඳාම ගව පාලනය, දුනු ශිල්පය, රාජ්‍ය සේවය වෙනත් ශිල්ප කර්මාන්ත

<u>ආරක්ඛ සම්පදා</u> - ධාර්මිකව උපයාගත් ධනය විනාශ වී යා නොදීමට කටුයතු කිරීම, රාජසන්තක වීමෙන් සොර සතුරන්ගෙන්, ගින්නෙන්, ජලයෙන් විනාශවීම තමන් අකමැති අයට අයත්වීම.

**කල්‍යාණ මිත්තතා** - යහපත් මිතුරන් ඇසුර, කල්‍යාණ මිත්තතා ඇසුරු කරන්නා තුළ සද්ධා, ශීල, ත්‍යාග, ප්‍රඥා යන ගුණ ධර්මවලින් යුක්ත විය යුතුය. එම ගුණ ධර්ම අනුව තම චරිතය සකසා ගැනීමට හැකිවේ.

**සමජීවිකතාවය** - ආදායම හා වියදම (අය, වැය) මනාව තුලනය කරගැනීමකි. අඩු ආදායම ඇතිව වැඩියෙන් වියදම් කරන්නා (උදුම්බරබාදික) එයට හේතුව අනුකරණය වේ. එය පිරිහීමට හේතුවකි.

(iii) ව්‍යග්ගපජ්ජ, මහාමංගල, පරාභව, සූත්‍ර දේශනා තුලින්පුද්ගලයාගේ මෙලොව දියුණුවට මෙන්ම පරලොව දියුණුවට අදාල ධර්ම කරුණු රාශියක් දක්වේ. මේවා පිළිපැදීම තුලින් තමාගෙත් සමාජයෙත් යහපත පිණිස හේතුවේ. පුද්ගල දියුණුව හා පිරිහීම සිදුවන අයිරු වටහාදෙන මේ කරුණු ප්‍රායෝගිකව ක්‍රියාවේ යෙදීමෙන් පුද්ගලයාගේ අධ්‍යාත්මික ආර්ථික සමාජීය ජීවිතය පිරිහීමට පත් නොවී අර්ථවත්ව සාර්ථක කරගැනීමට ඉවහල් වේ. උදාඃ- මහා මංගල සූත්‍රයේදී අනුවණයන් ඇසුරු නොකිරීම, නුවණැත්තන් ඇසුර පුද්ගල පෞරුෂයට බලපායි. එසේම සීලාදී ගුණධර්මයන්හි පිහිටීමේ කය, වචන සංවර කරගැනීම පවා දක්වයි. එය ද මුල් ජීවිතයම සාර්ථක කරගැනීමට ඉවහල් වන්නකි. පරාභව සූත්‍රයේදී නුවණැත්තෝ ධර්මයට කැමැති බව ද අනුවණයෝ ධර්මයට අකමැති බවද, කුසල් අකුසල් තමා තේරුම් ගත යුතු බව කියැවේ. එසේම යමෙකුගේ පිරිහීම ඍජුවම බලපාන නිතර නිදන සුළු බව, අලසකම, උත්සාහයෙන් තොර බව පිරිහෙන කරුණු ලෙස පරාභව සූත්‍රයේ දක්වයි. මංගල සූයේදී මව්පිය උපස්ථානය කෙලෙහිගුණ දැක්වීම, උවටැන් කිරීම යුතුකමක් ලෙස දක්වයි. සභාවේ ඇලුණු බව හෙවත් කථාවෙන් දවස ගෙවීම මුපාදූප කීම පිරිහීමේ ලක්ෂණයන්ය. සූදුවට සුරාවට ලොල්වීමෙන් දිළින්දකු වන බව සූත්‍ර ධර්මයේ දක්වේ. මේ අනුව සූත්‍ර දේශනා තුළින් මෙලොව දියුණුව පමණක් නොව පරලොව දියුණුව සඳහා ද කරුණු අන්තර්ගත බව පැහැදිලි ය.

(7) (i) ***පූජ්‍ය රේරුකානේ චන්ද විමල හිමි***

1897 ජූලි 19 දින රුබෙල් ගුණවර්ධන නිත් උපත ලබා 1906 ජනවාරි 08 බුරුමයේ විනයාලංකාර හිමි වෙතින් රේරුකානේ චන්ද විමල නමින් පැවිදි බිමට ඇතුල් විය. 1917 ඔක්තෝම්බර 26 දින බුරුමයේ ධම්මිකාරාම සීමා මාලකයේදී උපසම්පදාව ලැබීය. පොහොය දිනය, ධර්ම විනිශ්චය, බෞද්ධයාගේ අත්පොත, අභිධර්ම මාර්ගය, පාරමිතා ප්‍රකරණය, උන්වහන්සේ ලියන ලද ග්‍රන්ථ කිහිපයකි. ලියන දේ එක තාවේදීම ලියා මුද්‍රණයට යැවීම උන්වහන්සේගේ විශේෂිත හැකියාව විය. සංස්කෘත, පාලි, සිංහල, බුරුම භාෂා රාශියක් දැනසිටි උන්වහන්සේ සම්මාන පණ්ඩිත උපාධියද, කැලණිය විශ්ව විද්‍යාලයේ මහාචාර්ය පදවිය ද 1963 සාහිත්‍ය චක්‍රවර්තී උපාධිය ද පිරිනමන ලදී. 1976 ශ්වේජින් නිකායේ මහානායක ධූරයට පත් උන්වහන්සේ 1997 ජූලි 4 දින අපවත් විය.

(ii) ***පුරිස දම්ම සාරථී ගුණය***

මිනිස් තිරිසන් දේව, යක්ෂ, බ්‍රහ්ම, ආදීන් අතර නොහික්මුණ පිරිස හික්මවා ගැනීමට බුදුන්වහන්සේට වූ බලය පුරුෂ දම්ම සාරථී ගුණය ලෙස හැඳින්වේ. ඒ සඳහා උන්වහන්සේ භාවිතා කරනු ලැබුවේ කරුණාව, මෛත්‍රිය, ඉවසීම, ප්‍රඥාව වැනි අධ්‍යාත්මික ගුණාංගයන්ය. මේසඳහා උදාඃ- අංගුලිමාල දමනය, ආලවක යක්ෂ දමනය, නාලාගිරි දමනය, සච්චක දමනය, උපාලි ගෘහපති දමනය, තුන් බෑ ජටිල දමනය, මේ අයුරින් බුදුන්ගේ දමනයට පත්වූවන් පිළිබඳව ගුරුළුගෝමීන් ගේ අමාවතුර කෘතියේ විස්තර දක්වේ. (11 - 11 පිටුව)

(iii) **ස්ථූපය**

චෛත්‍යය, වෙහෙර, සෑය, දාගැබ, ථූපය, චේතිය ආදී විවිධ නමින් හඳුන්වන ස්ථූපයේ තැන්පත්ව ඇත්තේ බුදු පසේ බුදු මහරහත් යන උතුමන්ගේ ධාතු හා විවිධ පුද පූජා විතුන් ය. ත්‍රිවිධ චෛත්‍යය අතුරින් පළමුව වන්දනා කළ යුත්තේ ස්ථූපයට ය. එයට හේතුව ශාරීරික ධාතු තැන්පත්ව තිබීමය. ලංකාවේ ස්ථූප හැඩයෙන්ම ඉදිවූ පළමු ස්ථූපය ථූපාරාමය වේ. එය බුදුන්ගේ දකුණු අකු ධාතුව තැන්පත් කර දේවානම් පියතිස්ස රජු නිර්මාණය කරන ලදී. ගර්භයේ ස්වභාවය අනුව ස්ථූප වර්ග 6 කි. ඝණ්ටාකාර, ඝටාකාරථ බුබ්බුලාකාර, ධාන්‍යාකාර, පද්මාකාර, අම්ලාකාර වේ. සුථූපාංග ලෙස පේසා වළලු, ගර්භය, හතරැස්කොටුව, දේවතා කොටු, කොත් කැරැල්ල, චූඩා මාණික්‍යය දැකිය හැක. කුඩා ස්ථූප වටා අතංකාර වටදාගෙය නමින් ගොනුගිල්ල් විය. පැරණි ස්ථූපවල වාහල්කඩද දැකිය හැකි අංගයකි. ලංකාවේ විශාලතම ස්ථූප ඉදිකරවන ලද්දේ දුටුගැමුණු රජු මහසෙන් රජු හා වලගම්බා යන රජවරුන් විසිනි. (10 - 108 - 110 පිටු)

(iv) **සද්ධර්මරත්නාවලිය**

'සද්ධර්මය නම් මිණිකැට ඇමුණු මාලය' යන අරුතින් ලියවුණ සද්ධර්ම රතනාවලිය ධර්මසේන හිමියන්ගේ කෘතියකි. ගැමි වහරට සමීප වූ උපමා උපමේය වැඩියෙන් යොදාගෙන චරිත හා අවස්ථා නිරූපණය කර ඇත්තේ මනරම් ලෙසය. ගැමි ජනයාට සමීප වහරින් කථා රීතිය යොදා ගැනීම සද්ධර්මරත්නාවලි කතුවරයාගේ ආවේණික ලක්ෂණයකි. පාලි ධම්මපදට්ඨ කථාව ඇසුරෙන් රචනා වුවද එය මෙරට ගැමි හදවත් තුලට සමීප කරලීමට උන්වහන්සේට හැකිවූයේ ගැමි ජීවිතයෙන් ලත් අත්දැකීම් නිසාය. සද්ධර්මරත්නාවලිය තුලින් මතුවන්නේ පුස්කොල පොත් සුවඳ නොව ගැමි ජීවිතයේ සුවඳ යැයි මාර්ටින් වික්‍රමසිංහ ශූරීන් පවසන්නේ එහෙයිනි. (10 - 121 පිටුව)